# මහායාන බෝධිසත්ත්ව භූමි සංකල්පය පිළිබඳ විමසීමක්

බුද්ධයාන, බෝධිසත්ත්වයාන ඒකයාන යන පර්යාය නම්වලින් හැඳින්වෙන මහායාන[1] බුදුදහම බුද්ධපදප්‍රාප්තිය නිෂ්ඨාකොට පවතී. බුද්ධත්වය සාක්ෂාත් කිරීම සඳහා මේ දහම මගින් ඉදිරිපත් කෙරෙන ප්‍රතිපදාව හැඳින්වෙන්නේ බෝධිසත්ත්ව චර්යාව වශයෙනි. ඒ බුද්ධත්වයට පත්විය හැකි එකම මාර්ගය බෝධිසත්ත්ව චර්යාව වන හේතුවෙනි. බෝධිසත්ත්ව චර්යාවේ නෛසර්ගික අංගයන් අතුරෙන් භූමි හා පාරමිතා යන අංග ද්වයය ඉතා වැදගත් ය. බෝධිචිත්තය උපදවාගෙන බෝධිසත්වයෙකු බවට පත් වී අරියපර්යේෂණයේ යෙදෙන අයකුට අනුක්‍රමයෙන් නිෂ්ඨාව වෙත ළඟාවීමට භූමියෙන් භූමියට ඉහළ නැංග හැකිවන්නේ පාරමිතා පරිපූර්ණයෙන්ය. මෙසේ සලකා බලන කල මහායානය යනු පාරමිතා පූරණය වශයෙන් හැඳින්විය හැකිය. ඒනිසා මහායානය හැඳින්වීම සඳහා පර්යාය පදයක් වශයෙන් "පාරමිතායාන" යන්න යෙදීම සහේතුක බව පෙනේ.[2]

ආරම්භයේ ම අඤ්ඤාරාධනය (ඥත්‍යාවබෝධය) සිදු නොවන බවත් එය සිදුවන්නේ අනුපූර්ව ශික්ෂාවක් අනුපූර්ව ක්‍රියා මාර්ගයත් අනුපූර්ව ප්‍රතිපදාවක් මඟින් බවත් බුදුන්වහන්සේ මජ්ඣිම නිකායයේ කීටාගිරි සූත්‍රයේ දක්වා ඇත.[3] භූමි සංකල්පය මඟින් ද මෙය පැහැදිලි කෙරෙන්නේ බෝධිසත්ත්ව චර්යාවේ ඇති අනුපූර්වතා ලක්ෂණ ලෙසය.

'භූමි' යන පදය පාලි හා සංස්කෘත භාෂා ද්වයයේම යෙදේ. සාමාන්‍යයෙන් පොළොව භූමිය යන අරුතින් හැරුණු විට මෙම පදය "ස්තරය" "තත්ත්වය" "තලය" වැනි අරුත්ද ප්‍රකාශ කෙරෙන පරිදි පිටක මූලාශ්‍රයවලද යෙදී ඇත.[4] පාලි සම්ප්‍රදායයේ මෙම පදය බෝධිසත්ත්ව සංකල්පය හා සම්බන්ධව යෙදෙන්නේ අටුවා ග්‍රන්ථවල බව ආචාර්ය තොෂිඉචි එන්දෝ[5] පෙන්වා දෙයි. බුද්දක පාඨ අටුවාවේ චරියාපිටක අටුවාවේ බෝධිසත්ත්ව භූමි යන යෙදුම දක්නට ඇති බව ආචාර්ය ටී.එන්දෝ එහි සඳහන් කරයි.

එහෙත් සංස්කෘත සම්ප්‍රදායයේ බෝධිසත්ත්ව චර්යාවේ විවිධ ස්තර තල හැඳින්වීම සඳහා භූමි යන පදය මීට පෙරාතුව ම යෙදී ඇති බව සංස්කෘත මූලාශ්‍රය මගින් සනාථ වේ. බෝධිසත්ත්ව සංකල්පය මෙන්ම භූමි සංකල්පය ද ප්‍රාග්-මහායාන යුගයට අයත් බව පැහැදිලිව දක්නට ඇත. භූමි යන පදය බෝධිසත්ත්ව චර්යාවේ තල හෝ ස්තර හැඳින්වීම සඳහා යෙදෙන මූලාශ්‍රය අතුරෙන් මහාවස්තුව ඉපැරණි කෘතියක් වේ. මහාසාංඝික සම්ප්‍රදායට අයත් කෘතියක් සේ සැලකෙන මෙය[6] මහායානය බිහිවීමට බොහෝ කලකට පෙර සම්පාදනය වූවකි. සර්වාස්තිවාදී සම්ප්‍රදායට අයත් කෘතියක් වන අභිධර්මකෝෂයෙහි ද මෙම සංකල්පය ගැන සඳහන් වේ. එමෙන්ම මහායාන කෘති වශයෙන් ගැණෙන ප්‍රඥාපාරමිතා[7] සාහිත්‍යයේ ද මෙම සංකල්පය විස්තර කෙරේ. භූමි පදය මෙලෙස පාරිභාෂික පදයක් වශයෙන් මහායාන කෘතිවල

යෙදුණු අවස්ථා රැසක් හර් දයාල් සඳහන් කරයි.[8] සමහර තැනක භූමි යන පදයට පර්යාය වශයෙන් විහාර යන පදය ද යෙදේ. මහායාන සූත්‍රාලංකාරයේ මෙසේ යෙදී ඇත.[9]

ඉහත සඳහන් කරුණුවලින් පැහැදිලි වන එක් වැදගත් දෙයක් නම්, පරමාදර්ශයක් වශයෙන් බෝධිසත්ත්ව සංකල්පය ස්ථාපිත වූයේ මහායාන බුදු දහමෙහි වුවද එහි ක්‍රමික වර්ධනය නිකායාන්තර බුදු දහම ප්‍රචලිත වුණු සමයට අයත් වන බවය. බෞද්ධ සංඝ සංවිධානය නිකායවලට බෙදී යැමට හේතු වුණු විවිධ හේතූන් අතර අර්හත් පරමාදර්ශයට එරෙහි ව සංඝ සමාජය තුළ මෙන්ම ගිහි සමාජය තුළ ද ක්‍රමයෙන් වැඩෙමින් පැවති විරෝධය හේතු වුණු බවට නිශ්චිත සාධක ඇත. මහාදේවයන්ගේ පංචවිධ විවේචනයන් මෙයට ඇති එක් ප්‍රධාන සාක්ෂියකි.[10] සාම්ප්‍රදායික භික්ෂූන් පරියත්තියට නැඹුරු වීම හේතු කොටගෙන ඒ භික්ෂු පිරිස ගිහි සැදැහැවතුන්ගේ ආගමික අවශ්‍යතාවන් ඉටු කිරීමට එතරම් කැප නොවීම ගිහි පිරිස් හා භික්ෂූන් අතර පැවති සම්බන්ධය දුරස්ථ කිරීමට හේතු වුණා විය හැකිය. මේ අතර බුද්ධාභිවාදනයට ම කැපවුණු එක්තරා උපාසක පිරිසක් සිටි බවට ද චීන මූලාශ්‍රයයන් මඟින් සාක්ෂ්‍ය ලැබෙතැයි හිරකාවා අකිරා ඔහුගේ කෘතියෙන් පෙන්වා දෙයි.[11] බුද්ධචරිත සම්පාදනය කිරීමට පුරෝගාමී වූවෝ ද මේ පිරිස් ය. එසේම බෝධිසත්ත්ව සංකල්පය වර්ධනය කිරීමට හා ජනප්‍රිය කිරීමට මූලික වශයෙන්ම ඉදිරිපත් වන්නට ඇත්තේ ද මේ අන්දමේ උපාසක පිරිස් විය හැකි යැයි සාධාරණ අනුමානයක් කළ හැකිය. අර්හත් නැතහොත් ශ්‍රාවක පරමාදර්ශය ගැන එක්තරා දුරකට කලකිරී සිටි මේ පිරිස් තමන් බඳු පැවිදි නොවූ එහෙත් ආගමික දිවි පෙවෙතකට කැපවුණු ගිහි පිරිස් උදෙසා වඩා යෝග්‍ය පරමාදර්ශයක් වශයෙන් බෝධිසත්ත්ව සංකල්පය දුටුවා විය හැකිය. බුද්ධත්වය පරම නිෂ්ඨාව කොට ඇති බෝධිසත්ත්ව චර්යාව භූමියෙන් භූමියට යන අයුරින් ක්‍රමිකව සැකසීම ඇරඹෙන්නට ඇත්තේ මේ පිරිස් අතින් විය හැකි යැයි සහේතුකව සිතිය හැකි ය.

මුල් අවධියේ දී බෝධිසත්ත්ව භූමි සංකල්පය මහායාන අදහස්වලට නැඹුරුවුණු සියලු ම බෞද්ධයන් විසින් පොදුවේ පිළිගැනුණු බවක් දක්නට නැත. එය හුදු සමාවෘත්තිය පමණක් බව ප්‍රඥා පාරමිතා ශතසහස්‍රිකාවේ වෙතියි වියත්හු පෙන්වා දෙති. බෝධිසත්ත්ව චර්යාව විස්තර කිරීම සඳහාම සම්පාදනය කෙරුණු බෝධිචර්යාවතාරයෙහි භූමි පිළිබඳව සඳහන් වන්නේ නැත. එමෙන් ම මහායාන සූත්‍රාලංකාර ශික්ෂාසමුච්චය වැනි කෘතිවල භූමි පිළිබඳව දීර්ඝ විස්තර අඩංගු නොවේ. එහෙත් එම කාලයටම අයත් යැයි සැලකිය හැකි මාධ්‍යමකාවතාර බඳු කෘතීන්හි භූමි සංකල්පය සවිස්තරව ඉදිරිපත් වේ.[12]

කරුණු මෙසේ වුවද, ඉතා පැරණි අවධියක සිටම බෝධිසත්ත්ව චර්යාව කිසියම් අයුරකින් ක්‍රමානුකූලව සකසා ඉදිරිපත් කිරීමට උත්සාහ ගනු ලැබුණු බව නම් පැහැදිලිය. මේ අතරින් ඉපැරණිම උත්සාහයක් වශයෙන් මහාවස්තුවෙහි එන විස්තරය දැක්විය හැකිය. මේ ක්‍රමානුකූල සැකසීම අදියර තුනකට වෙන්කොට දක්වන ඒ.සී. බැනර්ජි නම් ඉන්දීය විද්වතා කියන්නේ මුල් අදියර මහාවස්තුවෙන් ද දෙවන අදියර ප්‍රඥා පාරමිතා සාහිත්‍යය මඟින්ද තුන්වන අදියර දශභූමික සූත්‍ර වැනි කෘති මඟන් ද සිදුවී ඇති බවය.[13]

මහාවස්තුවෙහි භූමි දහයක් නම් කෙරේ. ඒවා නම්: (1) දුරාරෝහා (2) බුද්ධමාතා (3) පුෂ්පමණ්ඩිතා (4) රචිරා (5) චිත්ත විස්තරා (6) රූපවතී (7) දුර්ජයා (8) ජන්මනිර්දේශ (9) යෞවරාජ හා (10) අභිෂේක යනුයි. භූමි දහයක් නම් කෙරුණත් මේ නම් හා දශභූමික සූත්‍රයේ සඳහන් භූමි දහයේ නම් අතර සමාන බවක් නැත. එපමණක්ද නොව මහා වස්තුවෙහි භූමි දහයක් නම් කොට විස්තර කෙරුණද එම විස්තරය ක්‍රමවත් නැත. මෙම විස්තර භූමි සංකල්පයේ ප්‍රාථමික අවස්ථාවක් පිළිබිඹු කරන බවට අනුපිළිවෙළින් කෙරී ඇති එම විස්තරයම සාක්ෂියක් වේ.

ප්‍රඥාපාරමිතා ශත සහස්‍රිකාවේද භූමිදහයක් දැක්වෙන බව සඳහන් වේ.[14] මේ නම් අතර ශුක්ලවිපශ්‍යතා ගෝත්‍ර අෂ්ටමක දර්ශන තනු වීතරාගී ආදිය වේ. මේ නම් සෙසු කෘතිවල යෙදෙන නම්වලට වඩා හාත්පසින්ම වෙනස් ය. බෝධිසත්ත්ව චර්යාව විස්තර කෙරෙන තවත් ඉතා වැදගත් කෘතියක් වන බෝධිසත්ත්වභූමි නම් කෘතියෙහි භූමි හතක් හා මුසුවුණ විහාර දහතුනක් පිළිබඳව පුනරුක්තිවලින් ගහණ විස්තර ඇතුළත් ය. මේ විස්තරයෙහි ඇතුළත් භූමි හා විහාර මෙසේය:

(1) ගෝත්‍ර භූමි — ගෝත්‍ර විහාර

(2) අධිමුක්ති චර්යා භූමි — අධිමුක්ති චර්යා විහාර

(3) ශුද්ධාශය භූමි — ප්‍රමුදිතා විහාර

(4) චර්යා පත්‍රපත්ති භූමි — මෙයට විහාර හයක් ඇතුළත්ය.
ඒවා නම්: අධි ශීල, අධිචිත්ත, අවිප්‍රඥා
(මේ නම් විහාර තුනක් වේ)

(5) නියතා භූමි — නිර්මිත්ත විහාර

(6) නියත චර්යා භූමි — ප්‍රතිසම්විද් සහ සාභෝග නිර්මිත්ත විහාර

(7) නිෂ්ඨාගමන භූමි — මෙයට පරම විහාර හා තථාගත විහාර යන විහාර දෙක ඇතුළත්ය

බෝධිසත්ත්ව භූමි නම් කෘතිය දශභූමික සූත්‍රයට පසුව ලියැවුණකි. එහි කර්තෘ මෙම භූමි විහාර දශභූමික සූත්‍රයෙහි දැක්වුණු භූමිවලට සමාන්තර යයි හුවා දැක්වීමට ගෙන ඇති උත්සාහය සාර්ථක නැත. මෙම භූමි සංකල්පය සකසා ඇත්තේ සීල-සමාධි-ප්‍රඥා යන ත්‍රිශික්ෂාව පාදක කොට ගෙන බව පෙනේ. දශභූමික සූත්‍රය සම්පාදනය වීමෙන් අනතුරුව ඊට වඩා ක්‍රමවත් වීමෙන්, ඊට වෙනස් වූ වර්ගීකරණයක් පාදක කොටගෙන භූමි සංකල්පය සකසා විස්තර කිරීමට බෝධිසත්ත්වභූමි සම්පාදකයා උත්සාහ ගෙන ඇති මුත්, එය සාර්ථක ක්‍රමවත් උත්සාහයක් වශයෙන් හැඳින්විය නොහැකි බව විද්වතුන්ගේ මතයය.[15]

බුද්ධ පදප්‍රාප්තිය සඳහා වූ ආධ්‍යාත්මික ප්‍රගති ගමන දසභූමික
සූත්‍රය ආශ්‍රයෙන් විමර්ශනය කිරීම

බෝධිසත්ත්ව භූමි සංකල්පය ක්‍රමවත් ලෙස ඉදිරිපත් කිරීමට ගනු ලැබුණු උත්සාහයන් අතුරෙන් වඩා සාර්ථක උත්සාහය පිළිබිඹු වන්නේ දශභූමික සූත්‍රයෙහි බව පොදු පිළිගැනීම ය. බෝධිසත්ත්ව චර්යාව සමන්විත වන භූමි සංඛ්‍යාව දහයක් ය යනු නිශ්චිත ලෙස තීන්දු කරනු ලැබුණේ ද එය සිද්ධාන්තයක් ලෙස පිළිගනු ලැබුණේද දශභූමික සූත්‍රය මඟින් ඉදිරිපත් කෙරුණු විස්තරය හේතුකොට ගෙන බව විද්වත්හු පෙන්වා දෙති.[16] බෝධිසත්ත්වයකු අනුක්‍රමයෙන් භූමියෙන් භූමියට පත් වෙමින් සීල-සිද්ධි ගුණ දියුණු කරගනිමින් ක්‍රමිකව නිර්මලත්වයට පත් වන රත්රන්මෙන් පාරිශුද්ධියට පත් වන ආකාරය මේ කෘතිය මගින් විස්තර කෙරේ. මෙම කෘතියෙහි දැක්වෙන භූමි දහය මෙසේ ය.

(1) ප්‍රමුදිතා (2) විමලා (3) ප්‍රභාකරී (4) අර්චිස්මතී (5) සුදුර්ජයා (6) අභිමුඛී (7) දූරංගමා (8) අචලා (9) සාධුමතී සහ (10) ධර්මමෙඝා යනුයි.[17]

බෝධිසත්ත්වභූමි සූත්‍රය මගින් ඉදිරිපත් කෙරෙන බෝධිසත්ත්ව චර්යා විස්තරය ශීල-සමාධි-ප්‍රඥා යන ත්‍රිශික්ෂාවන් පාදක කොට ඇතැයි පිළිගන්නා වියත්හු දශ භූමික සූත්‍රයෙහි දැක්වෙන විස්තරය පාරමිතා සංකල්පය මත සැකසී ඇතැයි අදහස් කරති. පාරමිතා පිරීම බෝධිසත්ත්ව චර්යාවේ සුවිශේෂ අංගයක්ය යන්න පාලි සම්ප්‍රදායය මඟින්ද පිළිගැනේ.[18] ජාතක කථා මඟින් කෙරෙන්නේද බෝසතුන් විවිධ උත්පත්තිවලදී පාරමී පූරණයෙහි නියුතු වූ ආකාරය දැක්වීමයි. පාලි නිකාය ග්‍රන්ථ අවධියේදී පාරමිතා සංකල්පයන් නොවුවද පසු අවධියක පාරමිතා පූරණය බෝධිසත්ත්ව චර්යාවේ ප්‍රගතියට අත්‍යාවශ්‍ය අංගයක් වශයෙන් සැලකුණ බැව් ඛුද්දක නිකායයට අයත් චරියා පිටක බුද්ධවංස ආදී කෘතිවලින් පැහැදිලි වේ.[19] පාරමිතා පූරණය බෝධිසත්ත්ව චර්යාවේ ප්‍රධාන අංග ලෙස පිළිගැනෙන්නට වූයේ බෝධිසත්ත්ව චර්යාව බුද්ධපදප්‍රාප්තියට උපස්තම්භක වන පරමාදර්ශය බව පිළිගනු ලැබීමෙන් අනතුරුව විය යුතු ය. මෙම පිළිගැනීම ථෙරවාද-මහායාන භේදයකින් තොරව පොදුවේ සිදු වී ඇති බැව් මේ අංශද්වයයට අයත් කෘතිවලින් පැහැදිලි වේ. පැරණි සාම්ප්‍රදායික විග්‍රහයන් ඉදිරපත් කරන අටුවාචාරීන් වහන්සේලා පාරමිතා පූරණයේ ඇති වැදගත්කම මනාව හුවා දක්වති. බුද්ධවංසය පාරමිතා "බුද්ධකාරාධම්මා"[20] වශයෙන් විස්තර කරන අතර එහි අටුවාව තව දුරටත් කරුණු පැහැදිලි කරමින්, "බුද්ධකාරානාම ධම්මා" හඳුන්වන්නේ "බෝධිපාචනා"[21] යනුවෙනි. මධුරත්ථවිලාසිනිය එයට අටුවා සපයමින් "මග්ගපරිපාචන" සබ්බඤ්ඤුත ඤාණපරිපාචන යනුවෙන් විස්තර කරයි.[22]

භූමි සංකල්පය ක්‍රමවත් කොට සකස් කිරීමේදී පාරමිතා සංකල්පය බෙහෙවින් වහල් කොටගෙන ඇති බැව් දශභූමික සූත්‍රය පිරික්සීමේදී පෙනේ. මෙම සූත්‍රය මගින් ඉදිරිපත් කෙරෙන, ක්‍රමයෙන් ඉ හළට යන දශ භූමි පිළිබඳ සැකැස්මේ එක් එක් භූමියක් සඳහා වෙන් වුණු එක් එක් පාරමිතාව දැක්වේ. ප්‍රථම භූමිය වන ප්‍රමුදිතා භූමියේ දී ඥාන පාරමිතාව පූරණය කිරීමෙන් අරඹන මේ පාරමිතා පූරණය ක්‍රමයෙන් දෙවන භූමියේ දී ශීල පාරමිතාවත් තුන්වන භූමියේදී ක්ෂාන්ති පාරමිතාවත් ආදී වශයෙන් පරිපූරණයට පත් කොට ධර්මමිඝා නම් දසවන භූමියේ දී ඥාන පාරමිතාව පරිපූර්ණත්වයට පත් කිරීමෙන් අවසන් කෙරේ.

බෝධි සංකල්පය සැකසීමේදී පාරමිතා පූරණය ඊට සම්බන්ධ කිරීමට දශ භූමික සූත්‍ර සම්පාදකවරයා උත්සුක වී ඇත්තේ හුදෙක් මෙම සංකල්ප දෙක එකතු කිරීම පිණිසම නොවේ. මේ අවධිය වන විට පාරමිතා සංකල්පය දියුණුව පැවතියේය. පාරමිතා පූරණය බෝධිසත්ත්ව චර්යාව සාර්ථක කර ගැනීමට අත්‍යවශ්‍ය බව තරයේම පිළිගනු ලැබුණු යුගයකි ඒ. පාරමිතා සංඛ්‍යාව දහයක් දක්වා වැඩි කෙරුණේ දශම ක්‍රමය මෙම අවධියේ දී ප්‍රචලිත වීම හේතු කොට යැයි හර් දයාල් පවසයි.[23] එහෙත් ථෙරවාදීන් අතර පාරමිතා දහයක් පිළිබඳ සංකල්පයක් ඊට පෙරාතුවම පැවති බවත් මහායානිකයන්ද ඒ අනුව පාරමිතා සංඛ්‍යාව දහය දක්වා වැඩි කිරීමට පියවර ගෙන ඇති බවත් සිතීම වඩා හේතු යුක්තය.

බෝධිසත්ත්ව සංකල්පය හුදෙක් එක් ගුරුකුලයකට සීමා වී දියුණු වූවක් නොවේ. ථෙරවාද-මහායාන යන දෙපාර්ශ්වයේම මෙම සංකල්පය සමාන්තරව දියුණු වුණු අතර ඒ පිළිබඳව වූ මතිමතාන්තර අන්‍යොන්‍ය වශයෙන් බලපාන්නට ද ඇත.

මුල් අවධියේදී මහායානිකයින් අතර වූ පොදු පිළිගැනීම පාරමිතාවන්ගේ සංඛ්‍යාව හයක් බවය.[24] මේ හය නම් දාන, ශීල, ක්ෂාන්ති, වීර්ය, ධ්‍යාන හා ප්‍රඥා යනුයි. පාලි සම්ප්‍රදායය ද පාරමිතා හයකට සීමා වුණු සංකල්පයක් පිළිබඳව දැන සිටි බව චරියා පිටක අට්ඨකථාවේ සම්පාදක කරන සඳහනකින් පැහැදිලි වන බව ටී.එන්දෝ ඔහුගේ කෘතියෙහි දක්වයි.[25] එහෙත් පාලි සම්ප්‍රදායයේ වඩා ප්‍රචලිත වූයේ දස පාරමිතා සංකල්පය ය. මේ දස පාරමිතා පිළිබඳ මුල්ම සඳහන බුද්ධවංසයෙහි වේ. මෙහි දැක්වෙන පාරමිතා දහය නම් (1) දාන (2) සීල (3) නෙක්ඛම්ම (4) පඤ්ඤා (5) වීරිය (6) ඛන්ති (7) සච්ච (8) අධිට්ඨාන (9) මෙත්තා සහ (10) උපෙක්ඛා යනුයි. පාලි සම්ප්‍රදායයේ එනම් ථෙරවාද සම්ප්‍රදායයේ බුද්ධකාරක ධර්ම වශයෙන් පාරමිතා දහයක් නම් කෙරෙන විට බුද්ධ හා බෝධිසත්ත්ව සංකල්ප වඩාත් දියුණුවට පත් කෙරුණු මහායාන සම්ප්‍රදායය පාරමිතා හයකින් තෘප්තිමත් වේ යැයි සිතීම හේතු යුක්ත නොවේ. පාරමිතා සංඛ්‍යාව දහය දක්වා වැඩි කිරීම මහායානිකයින්ට ද අනිවාර්ය විණි. ඒ වන විට පොදුවේ පිළිගෙන තිබුණු පාරමිතා හයට අලුතින් පාරමිතා හතරක් එක් කිරීමෙන් පාරමිතා සංඛ්‍යාව දහය බවට පත් කරගනු ලැබිණි. මෙලෙස එක් කරගනු ලැබුණු පාරමිතා නම් (7) උපාය නැතහොත් උපාය කෞශල්‍ය (8) ප්‍රණීධාන (9) බල සහ (10) ඥාන යනුයි.

බුද්ධකාරධම්මා බෝධි පාචනා ආදී වශයෙන් පාරමිතා විස්තර කර තිබීමෙන් පාලි සම්ප්‍රදායය මගින් පවා බුද්ධත්වය ලැබීම සඳහා පාරමිතා කෙතරම් අවශ්‍ය කොට සැලකුණේ ද යන්න පැහැදිලිය. මීට දෙවන නොවන ආකාරයකින් මහායාන ග්‍රන්ථ මඟින් ද පාරමිතා වර්ණනා කෙරී ඇති බැව් ප්‍රඥාපාරමිතා අෂ්ටසහස්‍රිකා ආදී ග්‍රන්ථයන් මඟින් හෙළි වේ.[26]

නව පාරමිතාවන් එක් කිරීමේදී හැකිතාක් දුරට පාලි සම්ප්‍රදායයට අයත් නොවන පාරමිතා නම් කිරීමට මහායානිකයින් උත්සුක වී ඇති බැව් ද දක්නට ඇත. මෙයද එම අවධියේ දී අත්‍යවශ්‍යයෙන්ම කළ යුත්තක් විය. අර්හත් පරමාදර්ශය අබිබවා බෝධිසත්ත්ව පරමාදර්ශය දියුණු කිරීමට නම් මෙවන් වෙනසක් කිරීම අත්‍යවශ්‍ය විය. එහෙත් මේ සඳහා යෝග්‍ය පාරමිතා සොයා ගැනීම එතරම් පහසු වී ඇති බවක් නොපෙනේ. ප්‍රණීධාන බල බඳු පාරමිතා එක් කිරීමට සිදු වී ඇත්තේ මේ හේතුවෙනි. ප්‍රඥා පාරමිතාවට අමතර වශයෙන් ඥාන නමින් පාරමිතාවක් ද

එක් කිරීමෙන් මේ බව වඩාත් සනාථ වේ. කෙසේ වුවද උපාය කෞශල්‍ය පාරමිතාවව එක් කිරීම හේතු කොටගෙන මෙම කාර්යය තරමක් දුරට හෝ සාර්ථක කර ගැනීමට හැකි වී ඇතැයි කිව හැකිය.

උපාය කෞශල්‍යය වනාහි බුදුන් වහන්සේගේ මහාකරුණාවේ ප්‍රායෝගික අංශයය. උන්වහන්සේගේ මහා කරුණා ගුණය ප්‍රදර්ශනය කෙරෙන්නේ මහා කරුණා ගුණය පොදු ජන හිත සුව පිණිස යෙදවෙන්නේ උපාය කෞශල්‍යය මඟිනි. ඇත්ත වශයෙන්ම බෝධිසත්ත්වයකු ශ්‍රාවකයකුට නැතහොත් රහතන් වහන්සේ නමකට වඩා ශ්‍රේෂ්ඨ කොට දැක්වීමට මහායානිකයින් උපයෝගී කොට ගත්තේ ද මෙම ගුණයය. එනිසා එය පාරමිතාවක් වශයෙන් එක් කර ගනු ලැබීම බෝධිසත්ත්ව සංකල්පයට කිසියම් ආකාරයක පරහිතකාමී, ගතික ශක්තියක් ඇතුළු කිරීමට උපකාරී වී ඇතැයි කිව හැකිය.

දශපාරමිතා සංකල්පය බෝධිසත්ත්ව සංකල්පය හා ක්‍රමානුකූලව ගොනු කිරීමෙන් දශභූමික සූත්‍ර සම්පාදකවරයා අපේක්ෂා කොට ඇත්තේ දශභූමි සංකල්පයට පදනමක් සැපයීමය. මහායානයේ විස්තර කෙරෙන පරිදි පාරමිතාවන් බෝධිසත්ත්වයකුගේ සරණය නම් රක්ෂාවරණය නම් එය බෝධිසත්ත්වයකුගේ දෙගුරුන් හා සමාන නම් සියලු පාරමිතා පරිපූර්ණත්වයට පත් කිරීම බෝධිසත්ත්වයකු විසින් අනිවාර්යයෙන්ම කළ යුතුය යන්න පිළිබඳව විවාදයක් පැවතිය නොහැකිය. එනිසා, එම පාරමිතා දහය පරිපූර්ණත්වයට පත් කිරීමට භූමි දහයක් තිබීම අත්‍යවශ්‍යය. භූමි සංඛ්‍යාව දහයක් වශයෙන් නිශ්චිත ලෙස තීන්දු කිරිමට දශභූමික සූත්‍ර සම්පාදකට මෙවන් කරුණු හේතු කාරක වන්නට ඇතැයි සිතිය හැකිය.

භූමි සංකල්පය ඈත අතීතයට යන්නක් වුවද එහි සංඛ්‍යාව පිළිබඳ නිශ්චිත නිගමනයන් නොවූ බව අදාළ මහායාන කෘතිවලින් පැහැදිලි වේ. භූමි සංඛ්‍යාව දහයක් ලෙස සාමාන්‍යයෙන් පිළිගැනුණද විවිධ කාල පරිච්ජේදයන්ට අයත් කෘතිවල මෙම සංඛ්‍යාව වෙනස් අයුරින් දැක්වෙන බව මීට පෙරද සඳහන් කරන්නට යෙදිණි. ඉතා පැරණි කාල වකවානුවකට අයත් වන මහාවස්තුව භූමි දහයක් ගැන සඳහන් කරයි. ඊට පසු කාලයට අයත් ලංකාවතාර සූත්‍රය දක්වන්නේ භූමි හතක් පමණි. මේ අතර ඊට පසු සමයෙක සම්පාදිතයැයි සැලකෙන බෝධිසත්ත්ව භූමි සූත්‍රය භූමි හතක් හා විහාර දහතුනක් ගැන කරුණු දක්වයි. භූමි යන්නට විහාර යන පදය පර්යාය යයි මහායාන සූත්‍රාලංකාරය සඳහන් කරයි.

මෙවැනි හේතුවලින් පැහැදිලි වන්නේ භූමි සංකල්පය අනුක්‍රමයෙන් වර්ධනය වූවක් බවය. මෙසේ අනුක්‍රමයෙන් වර්ධනය කරනු ලැබුණේ බෝධිසත්ත්ව චර්යාව ශ්‍රාවක නැතහොත් අර්හත් චර්යාවට වඩා ශ්‍රේෂ්ඨය යන විශ්වාසය සනාථ කිරීමේ අරමුණෙනි. මෙසේ කිරීමේ දී ශ්‍රාවක චර්යාව මුළු මනින්ම ප්‍රතික්ෂේප කරනු ලැබුණේ නැත. ශ්‍රාවක චර්යාව නිෂ්ඵලය, ඒ නිසා එයින් සම්පූර්ණයෙන් ම ඉවත් විය යුතුය. යන දැඩි ස්ථාවරයක මහායානිකයෝ නොපිහිටියෝය. ඔවුන් විසින් කරනු ලැබුණේ ශ්‍රාවක ප්‍රතිපදාව බෝධිසත්ත්ව චර්යාවේ ප්‍රාථමික අවස්ථාවක් වශයෙන් සලකා එය බෝධිසත්ත්ව චර්යාවට අඩිතාලම සපයන බව පෙන්වීමය.

ශ්‍රාවක චර්යාව අනුගමනය කරන්නෙක් වේවා, බෝධිසත්ත්ව චර්යාව අනුගමනය කරන්නෙක් වේවා ඔහු මේ ආධ්‍යාත්ම ප්‍රගති ගමන අරඹන්නේ පුථුජ්ජන (පෘථග්ජන) තත්ත්වයේ

සිටය. පාලි බුදු දහම අනුව මෙවන් පුථුජ්ජන පුද්ගලයෙක් ක්‍රමයෙන් සොතාපන්න, සකෘදාගාමි, අනාගාමි, අර්හත් යන මාර්ගඵල ලබා නිවන් පසක් කිරීමට සමත් වේ. මේ විශ්වාසය ප්‍රතික්ෂේප කළ ප්‍රාග්මහායානික එහෙත් ථෙරවාදී නොවූ බෞද්ධ තලවලට අයත් විද්වතුන්ගේ මතය වූයේ අර්හත් බව විමුක්තිය පසක් කිරිමට උපස්ථම්භක නොවන බවය. මහාසාංඝිකයෝ මේ අදහස ඍජුවම දැක්වූහ. අර්හත් බවෙන් ඔබ්බට එන බෝධිසත්ත්ව චර්යා ඔස්සේ තවත් ඉදිරියට ගමන් ගත යුතු යයි ඔවුහු අවධාරණය කළහ. මෙම චර්යා ද්වයයේ සමාන අසමාන කම් ගැන විද්වතුන් කරුණු දක්වා ඇත.[27]

පෘතග්ජනයකු විමුක්ති මාර්ගයට පූර්ණ වශයෙන් අවතීර්ණ වීමට පෙරුතු අවස්ථාව ථෙරවාද සම්ප්‍රදායයෙහි හඳුන්වන්නේ ගෝත්‍රභූ යන පදයෙනි.[28]

පාලි හා සංස්කෘත යන සම්ප්‍රදාය දෙකෙහිම මෙම අවස්ථාව ගැන සඳහන් වේ. පූර්ව සෝතාපන්න තත්ත්වයට අයත් මෙම අවස්ථාව මහාවස්තුවෙහි ප්‍රකෘතිචර්යා හා ප්‍රණිධානචර්යා වශයෙන් අවස්ථා දෙකක් වශයෙන් නම් කෙරේ. ලංකාවතාර සූත්‍රයෙහි පරිකර්ම භූමි වශයෙන් හැඳින්වෙන්නේද මේ අවස්ථාව ම ය. දශ භූමික සූත්‍රය මෙයට නමක් දක්වා නැති මුත්, විමුක්ති මාර්ගාවතීර්ණය ම පූර්ව වන මෙම අවස්ථාව පිළිබඳ දීර්ඝ විස්තර ඉදිරිපත් කරයි. "" "බෝසත්වරුන්ගේ ඒ චිත්තය (බෝධි චිත්තය) උත්පාද කරනු ලැබේ. යම් චිත්තෝත්පාදයත් සමග ම බෝධිසත්ත්වයා අතික්‍රාන්ත වෙයි ද෴ පෘථග්ජන භූමිය ඉක්මවන්නේ වෙයිද෴ බෝධිසත්ත්වභාවයො උපන්නෙක් වෙයි ද, තථාගත කුලයෙහි නිරවද්‍ය වූයේ වෙයි ද, සියලු ජාති වාදයෙන් වෙන්වූයේ වෙයි ද, ලෝකෝත්තර ගතියට ස්ථිර වූයේ වෙයි ද, බෝසත් ධර්මතාවෙහි මනා ව පිහිටියේ වෙයි ද, බෝධිසත්ත්ව නිවාසයෙන් සමථයට පැමිණියේ වෙයි ද, ත්‍රෛකාල වර්තිල තථාගත වංශයට නියත වූයේ වෙයි ද, සම්බෝධි පරායණ වූයේ වෙයි ද.29"

බෝධිසත්ත්ව භූමි නම් කෘතියෙහිප්‍රකෘති චර්යාව වශයෙන් හැඳින්වෙන මෙම අවස්ථාව ගෝත්‍රවිහාර හා අධිමුක්තිචර්යා විහාර වශයෙන් වර්ග කොට විස්තර කෙරේ. බෝධිසත්වයකු පළමුවන භූමියට පිවිසීමට අවශ්‍ය වන පූර්ව කොන්දේසි සපුරාලන්නේ බෝධිචිත්තය උත්පාදනය කරන්නේ මෙම අවස්ථාවේදී ය. ශ්‍රාවකයකු සෝතාපත්ති මගට පිවිසීමට අදාළ වන සියලු සුදුසුකම් ලබාගන්නේ ගෝත්‍රභූ අවස්ථාවේදී ය. ගෝත්‍රභූ අවස්ථාවෙන් පස බෝසත් වරයෙක් මුලින් ම එළඹෙන්නේ ප්‍රමුදිතා නම් භූමියටයි. එහිදී ඇති අධ්‍යාත්මික සතුට අප්‍රමාණය.

" පින්වත් ජිනපුත්‍රයෙනි, මේප්‍රමුදිතා නම් බෝධිසත්ත්ව භූමියෙහි සිටින්නාවූ බෝසත් තෙමේ, ප්‍රමෝද්‍ය බහුල වෙයි ප්‍රසාද බහුල වෙයි. ප්‍රීති බහුල වෙයි෴ ප්‍රීතියෙන් ඉපිලී යයි.".[30]

බෝධිසත්වයකු පළමුවන භූමියේ දී හා ශ්‍රාවකයකු සෝතාපත්ති මාර්ගයෙහි දී ප්‍රගුණ කරන සමහර මූලික අධිශීල ගුණාංගයන් අතර සමාන කමක් දක්නට ඇතත් බෝධිසත්වයකු විසින් දියුණු කරනු ලබන නොයෙක් සමාධීන් පිළිබඳව ශ්‍රාවක චර්යාවේ සඳහන් වන්නේ නැත. ශ්‍රාවකයකු ගෝත්‍රභූතත්ත්වයේ සිට අධිසීල අධිචිත්ත අධිපඤ්ඤා ගුණ ප්‍රගුණ කර අර්හත් භාවයට පත්වන ආකාරයෙන් බෝධිසත්වයකු ගෝත්‍ර විහාර අධිමුක්තිචර්යා විහාර, ප්‍රමුදිතා විහාර, අධිශීල

විහාර, අධි චිත්ත විහාර, අධි ප්‍රඥා විහාර ආදියට පත් වී තථාගත තත්ත්වයට පත්වන ආකාරය බෝධිසත්ව භූමියෙහි විස්තර කර ඇත.

ශ්‍රාවක චර්යාවේ සෝතාපන්න සකදගාමි අනාගාමි වශයෙන් ශ්‍රාවකයකු විමුක්ති මාර්ගය ඔස්සේ දියුණු වන ආකාරයට සමාන විස්තරයක් දශභූමික සූත්‍රයෙහි දැක්වෙන භූමි විස්තරයෙහි ද අඩංගු ය. දාන පාරමිතා පූරණයට ඉතා වැදගත් ස්ථානයක් ලබා දී තිබෙන අයුරු ප්‍රථම ප්‍රමුදිතා නම් භූමියේදී මනාව දැකිය හැකිය.

"බෝධිසත්ත්‍ව තෙමේ නැවත ප්‍රථම බෝධිසත්ත්‍ව භූමියෙහි හුන්නේ සියලු සත්ත්‍වයන් කෙරෙහි සාපේක්ෂ චිත්තය වඩා බුද්ධඥානය ලබාගැනීමේ උතුම් වූ අභිලාෂ බුද්ධියෙන් මහත් ත්‍යාගයන්හි යෙදේ ඒ ත්‍යාගයෝ මෙසේයි එනම්, ධනධාන්‍ය කෝෂ කෝෂ්ඨාගාර පරිත්‍යාගය හෝ, රන්රිදී මසු කහවණු පරිත්‍යාගය හෝ, අලංකාර වස්ත්‍රාභරණ පරිත්‍යාගය හෝ, ඇත්, අස්, රථ පරිත්‍යාගය හෝ උද්‍යාන තපෝවන විහාර පරිත්‍යාගය හෝ, දාසි දස් කම්කරු පුරුෂයන් පරිත්‍යාගය හෝ, ගම් නියම්ගම් ජනපද රාජ්‍ය රාජධානි පරිත්‍යාගය හෝ, භාර්යා පුත්‍ර දුහිතෘ පරිත්‍යාගය හෝ, සියලු ප්‍රියමනාප වස්තු පරිත්‍යාගය හෝ, හිස් කන් නාසා අත් පා ඇස් ස්වමස් ලේ ඇට ඇටමිදුළු, මේදය, සිවි හම් හදවත් සහ සියලු ආත්මභාවයම පරිත්‍යාගය හෝණි(වේ) ඒ සියලු වස්තු කෙරෙහි අනපේක්ෂිත වී බුද්ධඥානය ලබාගැනීමේ උදාර අභිලාෂ බුද්ධියෙන් අත්හරියි මෙසේ මේ ප්‍රථම බෝධිසත්ත්‍ව භූමියෙහි සිටියහුට මහත්‍යාග සම්භව වේ:"

එහි දැක්වෙන විමලා භූමිය එනම් දෙවන භූමියෙහි සෝතාපන්න සකදාගාමී යන අවස්ථා දෙකේම ලක්ෂණ අඩංගු ය. මෙහිදී විශේෂ අවධාරණය ශීලය ප්‍රගුණ කිරිම කෙරෙහි යොමු වී ඇත.

*"ඉක්බිති පින්වත් ජිනපුත්‍ර තෙමේ විමලා නම් බෝධිසත්ත්‍ව භූමියෙහි පිහිටියේ ප්‍රකෘති <u>දශකුශල කර්ම පථයන්ගෙන්</u>(දශභිඃ කුශලෛඃ කර්මපථෛඃ... )සමන්විත වූයේ වෙයි" ඒ දහය කවරේද යත්, ප්‍රාණාතිප්‍රාත ප්‍රතිවිරිත වූයේ වෙයි" දඬු ගැනීමෙන්, ආයුධ ගැනීමෙන්, වෛරීවීමෙන් තොරවූයේ, ලජජා හා දයාන්විත වූයේ, සියලු ප්‍රාණීභූතයන් කෙරෙහි මෛත්‍රී සහගත හිත සුඛානුකම්පි වූයේ වෙයි" හෙතෙම සංකල්පයෙනුදු කාම විහිංසාවන් නොකරයි. අන් සත්ත්‍වයන් කෙරෙහි උදාර සාත්ත්‍ව සංඥි වූයේ කාය විහෙඨනය කිරීම ගැන කවර පුනර්වාදයක්ද? අදත්තාදාන ප්‍රතිවිරතය වනාහි නැවත ස්වභෝගයෙහි සන්තෘෂ්ඨ වූයේ පරභෝගාභිලාෂී නොවූයේ, අනුකම්පා සහගත වූයේ වෙයි. හෙතෙම පරගෘහිත වස්තු විෂයෙහි පරගෘහිත සංඥිවූයේ වෙයි" සොර සිත උපදවා ඉතා කුඩා වූ තණපතකුදු නොගන්නේ වෙයි අනුන්ගේ ජීවිතෝපකරණ ගැනීමෙන් වෙන්වීම*

ගැන කවර කථාද" කාම මිථ්‍යාචාරයෙන් වෙන්වීම (කාම මිථ්‍යාචාර ප්‍රතිවිරතඃ) වනාහි ස්ව අඹුවගෙන් තෘප්තිමත් වූයේ පරාඹුවන් නොපතන්නේ වෙයි. හෙතෙම අන් අය විසින් රැකවරණය කරනු ලබන ස්ත්‍රීන් කෙරෙහිද ගෝත්‍ර මගින් ධ්වජයක් දැරීම මගින් නීතිය මගින් රැකවරණය සැපයෙන ස්ත්‍රීන් කෙරෙහිද අන්සතු භාර්යාවන් කෙරෙහිද කැමැත්තක් නූපදවයි. ලිංගිකව හැසිරීම ගැන කවර කථාද?

අසත්‍ය වචන වලින් තොරවීම වනාහි (අනෘත වචන) සත්‍යවාදී භූතවාදී කාලවාදී සහවාදී තථාකාරීවීමයි. හෙතෙම යටත් පිරිසෙයින් සිහිනෙනුදු දෘෂ්ටි දැරීම වශයෙන් රුචි ඉවසීම් වශයෙන් මතප්‍රේක්ෂක වශයෙන්, විරුද්ධ මත කැමැතිවීම වශයෙන් නොකියන ලද වචනයක් නොකියයි. දැන දැන බොරු කීම ගැන කවර කථා ද "කේලාම් කීමෙන් වෙන්වීම වනාහි සත්ත්වයින්ගේ පෙළීමට හා භේදයට උපකාරී නොවීමයි හෙතෙම නියත වශයෙන් අසා එසේ කියන්නේ භේද කිරීම කැමැති වෙයි වියවුල් නොකැමැත්තේ වියවුල්හි නොඇලුණේ, වියවුල් ඇති කරන සත්‍ය හෝ අසත්‍ය වචන කියන්නේ වෙයි

තවද පරුෂ වචනයෙන් වෙන්වූයේ වෙයි හෙතෙම යම් ඒ වචනයක් කර්කශවූයේ, පරකටුකවූයේ, කණට අමිහිරි වූයේ, ග්‍රාම්‍ය වූයේ හෘදය දවන්නේ, මනස් සන්තාපකාරී වූයේ, අප්‍රිය වූයේ, අමනෝඥ වූයේ, ස්වසන්තාන, පරසන්තාන මිලකරන්නේ වෙයිද එබඳු වචනය හැර යම් ඒ වචනයක් සිනිඳු මෘදු මනෝඥණී මධුර, ප්‍රියමනාප උපදවන, හිතකරන කර්ණසුඛ, හෘදයාංගම ප්‍රේමණීය, ප්‍රෞරිණී නුවණින් ශ්‍රවනය කළයුතු නිශ්චිත , බහුජන හිතවූ, බහුජන කාන්ත වූ, බහුජන ප්‍රිය වූ, බහුජන මනාප වූ, විඥාපන්න වූ, සියලු සත්ත්වයින්ට හිත සුව දෙන්නා වූ, සමාහිතවූ, මනස උත්පලාවනය කරන්නා වූ මනස ප්‍රහ්ලාපනය කරන්නාවූ ද ස්වසන්තානය හා පරසන්තාන ප්‍රසාද කරන්නා වූ ද එබඳු වූ වචනය කියයි, සම්ප්‍රලාපයෙන් තොරවීම නම් කාලවාදීව භූතවාදීව අර්ථවාදීව ධර්මවාදීව, විනයවාදීව මනාව පරිහරණය කරන ලද වචන ඇති බවයි හෙතෙම පිරිසිදු වචන සුදුසු කල්හි සාවධානව කියයි හෙතෙම යටත් පිරිසෙයින් ඉතිහාස පූර්වක වචනය පරිහරනය කරයි වාග් විකල්පනය ගැන කවර කථාද? අනභිධ්‍යාව වනාහි අන් අය නැමැති අන් අය පරිහරණය කරන, අන්සතු වස්තුවෙහි රිසිවීමකුදු උත්පාද නොකිරීවමයි.

*අන්සතු වස්තුවෙහි අභිධ්‍යාවක් (දැඩි ලෝභයක්)නූපදවීම ප්‍රාර්ථනා නොකිරීම, තැත් නොකිරීම, ලෝභ සිත නූපදවීම ගැන කවර කථාද?*

*අව්‍යාපන්න චිත්තනය ඉන්පසු ඇතිවෙයි සියලු සත්ත්‍වයන් කෙරෙහි මෛත්‍රීචිත්තය, හිතචිත්තය, දයාචිත්තය, සුඛචිත්තය, සිනිඳු සිතී සියලු ලෝකානුගත සිත, සියලු භූත හිතානුකම්පි සිත වේ හෙතෙම යම් ඒ ක්‍රෝධ උපකාහයෙන් හටගත් පරිදාහ දුකක් වේද ඒ සියල්ල හැර යම් ඒ අව්‍යාපාදයක් මෛත්‍රී උපසංහිත වූ සියලු සත්ත්‍වයන්ට හිතසුඛ වූ විතර්ක විචාරිත වේද එය අනුවිතර්කිත වෙයි ම්‍යක්දෘෂ්ටි වනාහි ඉන්පසු ඇතිවේ සැක උපදවන නානාප්‍රකාර නොහික්මුණු දෘෂ්ටිවලින් තොරව සෘජු දෘෂ්ටිවලින් යුක්තවී බුද්ධ ධර්ම සංඝයා කෙරෙහි නියත විශ්වාසය ඇතිවීමයි.හෙතෙම මේ දශකුශල කර්මපථයන් නිරන්තරයෙන්ම රක්‍ෂා කරන්නේ මෙසේ චිත්තාශයන් අභිනීහරණය කරයි.*[32]

අනාගාමි තත්ත්වයට පත්වන ශ්‍රාවකයාගේ වැඩි අවධානය අධිචිත්තය ප්‍රගුණ කිරීම කෙරෙහි ය. එමෙන් ම ප්‍රභාකරී නැතහොත් තුන්වන භූමියට පත්වන බෝධිසත්වයා ද විශේෂයෙන් සමාධිය ප්‍රගුණ කිරීම කෙරෙහි නැඹුරු වන ආකාරය දශ භූමික සූත්‍රයෙන් අවධාරණය කොට දැක්වේ.

*"ධර්මානුධර්ම ප්‍රතිපත්ති හේතුවෙන් කාමයන්ගෙන් හෝ පාප අකුශල ධර්මයන්ගෙන් තොර විතර්ක විචාර සහිත විවේක ප්‍රීතිසුඛ වූ ප්‍රථම ධ්‍යානයට එළඹ වාසය කරයි*

*හෙතෙම විතර්ක විචාරයන්ගේ ව්‍යසශමනයෙන් සංප්‍රසාදයට පත් සිත ඒකාග්‍රවීමෙන් විතර්ක විචාර රහිතව ප්‍රීති සුඛයෙන් යුත් ද්විතීය ධ්‍යානයට එළඹ වාසය කරයි. හෙතෙම ස්මෘතිමත් වූයේ සම්ප්‍රජානන වූයේ ප්‍රීතියෙහි විරාගය අපේක්‍ෂාවෙන් වාසය කරයී ශරීරයෙන් සැපයද විඳිනු ලැබේ. උපේක්‍ෂා සහගත ස්මෘතිමත් සුඛවිහාරීවූයේ තෘතීය ධ්‍යානයට එළඹ වාසය කරයී හෙතෙම සුඛයේ හා දුක්ඛයේ ප්‍රහාණයට පෙර සෝමනස්ස දෝමනස්සයන්ගේ අස්තයට යෑමෙන් සුඛයෙහි උපේක්‍ෂිත වූ ස්මෘතියෙහි පරිශුද්ධ වූ චතුර්ථධ්‍යානායට එළඹ වාසය කරයි. හෙතෙම සෑම අයුරින්ම රූපසංඥාව සමතික්‍රමණය කළේයී සතුරු සංඥාවෙන් අස්තගතව ගියේයී අනාත්ම සංඥාව සිහි කළේය. අනන්තාකාශ නම් ආකාසානාඤ්චායනනයට එළඹ වාසය කරයි. හෙතෙම හැම අයුරින්ම හෙතෙම සෑම අයුරින්ම විඤ්ඤාණඤ්චායතනය සමතික්‍රමණය කොට ආකිඤ්චඤ්ඤයතනයට එළඹ වාසය කරයී ඒ ධර්මානුධර්ම ප්‍රතිපත්තිය සඳහා මිස ඒවායෙහි අභිරතිය පිණිස නොවේ. හෙතෙම මෛත්‍රී සහගතවූ මහද්ගතවූ අප්‍රමාණවූ අවෛරීවූ අනාවරණ වූ අව්‍යාබාධ වූ සර්‍වත්‍රානුගත වූ සිතින් ධර්මධාතුව පරම කොට ආකාශ ධාතුව අවසාන කොට ඇති ලෝකය ස්පර්ශ කොට එළඹ වාසය කරයි. මෙසේ කරුණාසහගත මුදිතාසහගත උපේක්‍ෂා*

සහගත සිතින් වාසය කරයි. හෙතෙම නොයෙකුත් ඍද්ධි විධින් අනුභව කරයි. පොළවද කම්පා කරයි. එකෙක් වී බොහෝ දෙනෙක් වෙයි. බොහෝ දෙනෙක්ව සිට එකෙක් වෙයි. පහලවීම හා නැතිවීම අවබෝධ කරයි. බිත්ති අතරින් ප්‍රාකාර අතරින් පර්‍වත මධ්‍යයෙන් හිස් අවකාශයෙහි යන්නාක් මෙන් යයි. පක්‍ෂින් මෙන් ආකාශයෙහි පයඍංකයෙන් හැසිරෙයි. පොළවෙහි උඩට ඒම හා කිමිදීම කරයි. පොළව මත මෙන් ජලය මත ද යයි. මහා ගිනි ජාලයක මෙන් දැල්වෙයි. දුම් දමයි. මහාමේඝයක් මෙන් ස්වශරීරයෙන් මහාවාරිධාරා වගුරුවයි. යම්වාරි ධාරාවකගේ ගැලීමෙන් ත්‍රිසහස්‍ර මහා සහස්‍ර ලෝක ධාතු අදිප්ත වේද ප්‍රදිප්තවේද ගින්නෙන් එකප්ජවලිත වූයේ හමනු ලැබේ. මහා ඍද්ධි ඇති මහානුභාව සම්පන්න සඳහිරු පවා අතින් පරාමර්ශනය කරයි. ශරීරයෙන් බ්‍රහ්මලෝකය තෙක් පරාමර්ශනය කරයී වසඟ කරයී හෙතෙම මිනිසත් බව ඉක්ම වූ පිරිසිදු වූ දිව්‍යමය ශ්‍රෝත ධාතුවෙන් සූක්‍ෂම වූ ද ඕලාරික වූ උභය ශබ්ද අසයී දුර සිටි මැසි මදුරුවන්ගේ ශබ්ද පවා අසෙයි. (මේ දිව්‍යමය ශ්‍රෝතාභිඥාවයි)

හෙතෙම අන්සත්‍ත්වයන්ගේ අන් පුද්ගලයන්ගේ සිත හා සිතුවිලි ඇති සැටියෙන් දකියි. විරාග සිත විරාග සිත යැයි ඇති සැටියෙන් දකියි. දෝෂ සිත --- දෝෂ රහිත මෝහ සිත --- මෝහ රහිත සිත -- සක්ලේෂ සිත --- නික්ලේෂ සිත --අල්ප සිත --- විපුල සිත --- මහද්ගත සිත --- ප්‍රමාණ සිත --- සංක්‍ෂිප්ත සිත --- (විස්තීර්ණ සිත) --- සමාප්ත සිත --- අංගරහිත සිත --- ඔලාරික සිත, ඔලාරික සිත යැයි යථාපරිදි දැන ගනියි. මේ පරචිත්තඥානාභිඥා වයි.

හෙතෙම අනේකවිධ වූ පූර්‍වනිවාසානුස්මෘතිඥානය අනුස්මරණ කරයි. එක් ජාතියක්ද අනුස්මරණය කරයි. ජාති දෙකක් තුනක් සතරක් පහක් දහයක්, විස්සක්, තිහක්, හතලිහක් පනහක් අනුස්මරණය කරයි. අන්‍යයන්ගේ ජාතීන් (උප්පත්තීන්) සිය ගනනක්ද සිය දහස් ගනනක්ද, සංවර්ත කල්පයද විවර්න කල්පයද, අනේක වූ සංවර්ත විවර්ත කල්පයන්ද අනුස්මරණය කරයි. මේ පූර්‍වානිවාසානුස්මෘතිඥාන අභිඥාවයි.

හෙතෙම මිනිසත් බව ඉක්ම වූ දිව්‍යමය ඇසින් චුතවන්නාවූත් උපදින්නාවූත් සාවර්ණවූ දුර්වර්ණ වූ සුගත වූ දුගත වූ ප්‍රණීත වූ හීන වූ සත්ත්‍වයන් දකියි. කර්මානුරූපව ගියා වූ සත්ත්‍වයන් ඇති සැටියෙන් දැනගනියි. මේ පින්වත් සත්ත්‍වයෝ කාය දුශ්චරිතයෙන් සමන්වාගත වූයේ වාග්

*දුශ්චරිතයෙන් සමන්වාගත වූයේ මහත් දුශ්චරිතයෙන් සමන්වාගත වූයේ ආර්යයන්ට අපවාදක වූ මිථ්‍යාදෘෂ්ටි වූ මිථ්‍යාදෘෂ්ටි සමාදාන හේතුවෙන් කාබුන් මරණින් පසු සුගත ස්වර්ග දිව්‍ය ලෝකයෙහි උපදිනු ලැබේ, යැයි දකියි. මෙසේ මිනිසත් බව ඉක්ම වූ සයාකාර වූ නිමිති සහිත වූ සත්ත්වයන් දකියි. චුතවන්නාවූද උපදින්නාවූද සත්ත්වයන් යථාපරිදි දකියි. මෙසේ මිනිසත් බව ඉක්ම වූ සයාතන් වූ නිමිති සහිත වූ සත්ත්වයන් යථාපරිදි දකියි.*

*හෙතෙම මේ ධ්‍යාන විමොක්ෂ සමාධි සමාපත්තීන්ට පැමිණේ ඒවායින් නැගී සිටී. හුදෙක් මේ සමාධි සදහාම එසේ සමාධීන්ට පත් නොවේ"*[33]

හතරවන, පස්වන හා සයවන භූමිවලදී එනම් අර්චිස්මතී සුදුර්ජයා සහ අභිමුඛී යන භූමිවලදී බෝධිසත්වයා සුවිශේෂ වශයෙන් යොමු වන්නේ අධි ප්‍රඥාව දියුණු කිරීමටය.

හතරවනභූමිය,

එහි පින්වත් ජිනපුත්‍ර බෝධිසත්ත්ව තෙමේ අර්චිෂ්මති බෝධිසත්ත්ව භූමිය ලබාගැනීමත් සමගම තථාගත කුලයේ දශඥාන පරිචක්‍ර ධර්මයන්හි ධර්ම ප්‍රතිලමභනය පිණිස සංවෘත්තවූයේ වෙයි. ඒ දහය කවරේද යත්" අප්‍රත්‍යුවර්ත්‍යාශයතාවද, තිරත්නහේi ප්‍රසාද නිෂ්ඨාගමනතාවද" සංස්කාරෝදව්‍යය විභාවනතයාවද, ස්වභාවානුත් පත්‍යාශයතාවද" ලෝකප්‍රවෘත්ති නිර්වෘත්ත්‍යාශ යතාවද කර්මභයෝපපත්‍යාශයතාවද" සංසාරනිවර්‍ණාශයාතාවද, සත්ත්වක්ෂෙත්‍ර කර්මාශයතාවද පූර්‍වාන්තාපරාන්තාශයතාවද, අභාවක්ෂයාශයතාවද, භවත් ජිනපුත්‍ර බෝධිසත්ත්ව තෙමේ මේ දශ ඥාන පරිපචක ධර්මයන්ගෙන් සමන්වාගත වුයේ තථාගත කුලයෙහි එම ධර්ම ප්‍රතිලමභගනය පිණිස සංවෘත්ත වූයේ වෙයි. ඒ පින්වත් ජිනපුත්‍ර බෝසත් තෙමේ මේ අර්චිස්මතී නම් බෝධිසත්ත්ව භූමියෙහි පිහිටියේ අධ්‍යාත්මය කයින් කය දකිමින් අභිධ්‍යාදෝමනස්ස ලෝකයේහි කෙළෙස් තවන විරිය ඇත්තේ සම්ප්‍රජානන වූයේ ස්මෘතිමත් වූයේ වාසය කරයි"[34]

පස්වන භූමිය

*"හෙතෙම දශචිත්තාශය විශුද්ධි සමතාවන්ටද බැසගනියි. ඒ දහය කවරේද යත්" අතිත බුද්ධ ධර්ම විශුද්ධාශය සමතාවද, අනාගත බුද්ධ ධර්ම විශුද්ධාශය සමතාවද "ප්‍රත්‍යුත්පන්න (වර්තමාන)*

*බුද්ධ ධර්ම විශුද්ධාශය සමතාවද "ශීල විශුද්ධාශය සමතාවද චිත්ත විශුද්ධාශය සමතාවද" දෘෂ්ටිකාංක්‍ෂ විමති විලේඛාපන නයන විශුද්ධාශයතාවද මාර්ගාමාර්ගඥාන විශුද්ධාශයතාවද ප්‍රතිපත්තිප්‍රහාණඥාන විශුද්ධාශයතාවද සර්‍වබෝධි පක්‍ෂය ධර්මෝත්තර විභාවන විශුද්ධිසමතාවද සර්‍වසත්ත්‍වපරිපාචන විශුද්ධ්‍යාශය සමතාවද යන මේ දශ විශුද්ධි චිත්තාශය යන මේ දශ විශුද්ධිචිත්තාශය සමතාවන්ට බැස ගනියි.* [35]

සයවන භූමි

*"වජ්‍රගර්භ බෝසත් මෙසේ කීය. පින්වත් ජිනපුත්‍රවරුනි, යම් යම් පස්වන බොධිසත්ත්‍ව භූමියෙහි මනාව පරිපූර්ණ මාර්ග ඇති බෝසත් තෙමේ සයවන බෝසත් භූමියට බැස ගනියී හෙතෙම දශධර්ම සමතාවන්ට බැසගනියි ඒ දහය කවරේද යත් මෙසේයී සර්‍වධර්මනිමිත්ත සමතාව, සර්‍වධර්ම ලක්‍ෂණ සමතාව, සර්‍වධර්මානුත්පාද සමතාව සර්‍වධර්ම ආජාත සමතාවද, සර්‍වධර්ම නිමිත්ත සමතාවද, සර්‍වධර්මාධිවිශුද්ධි සමතාව සර්‍වධර්මනිෂ්ප්‍රපඤ්ච සමතාවද, ආනාව්‍යාහනිර්ව්‍යුහ සමතාවද, සර්වධර්මමා යාස්වප්නප්‍රතිභාසපූර්න සමතාවද, ආනාව්‍යාහනර්ව්‍යුහ සමතාවද, සර්ව ධර්මමයාස් වප්නප්‍රතිභාසපූර්‍ව ශ්‍රැත්තෝදකචන්‍ද්‍රප්‍රතිබිම්බ නිර්මාණ සමතාව ද සර්‍වධර්මභාවාභාවාද්‍ය සමතාවද යන මේ දශ සමතාවන්ට බැස ගනියි."* [35]

*"මේ අභිමුඛි නම් බෝධිසත්ත්‍ව භූමියෙහි පිහිටියාවූ බෝධිසත්ත්‍වයාට අවතාරශූන්‍යත් නම් සමාධිය හටගනු ලැබේ. ස්වභාව ශූන්‍යතාව පරමාර්ථශූන්‍යතාවී පරමශූන්‍යතාවීමහාශූන්‍යතාව සංප්‍රයෝගශූන්‍යතාව අභිනිර්හාර ශූන්‍යතාව --- යථාවදවිකල්පශූන්‍යතාව --- සාපේක්‍ෂ ශූන්‍යතාව, විනිර්භාග අවිනිර්භාග ශූන්‍යතාව නම් සමාධිය හටගනු ලැබේ. ඔහුට මෙසේ ප්‍රමුඛ වූ දශ ශූන්‍යතා සමාධිමුඛ සිය දහසක් අභිමුඛ වෙයි"* [37]

බෝධිසත්වභූමි සූත්‍රයෙහි ද අධිප්‍රඥා විහාර තුනක් සඳහන් කිරීමෙන් මෙම අවස්ථාවේදී ප්‍රඥාව ප්‍රගුණ කිරීමට හිමි වන තැන කෙතරම් වැදගත් ද යන්න පැහැදිලි වේ. සවන භූමියෙහිදී කළ සියලු කටයුතු අවසන් කරන බෝධිසත්වයාගේ තත්ත්වය අර්හත් ශ්‍රාවකයකුගේ තත්ත්වයට සමාන බව පෙනේ.

"යමෙක් මේ විමෝක්ෂ මුඛ තුන වඩන්නේ ආත්ම සංඥාවෙන් විරහිතවූයේ කාරක වේදක සංඥවෙන් බැහැර වූයේ භවාභව සංඥාවෙන් බැහැර වූයේ බහුල වශයෙන් මහාකරුණා පුරස්කෘතවූයේ නූපන් බෝධ්‍යාංග ධර්මයන්ගේ උත්පත්තිය පිණිස යෙදුණේ වෙයි."[38]

එහෙත් අර්හත් තත්ත්වයට පත්වීම බෝධිසත්වයකුගේ අරමුණ හෝ අභිප්‍රායය හෝ නොවේ. බෝධිසත්වයකු තවත් ඉදිරියට යා යුතුය. පූර්ණවිමුක්තිය ලැබීමට නම් අර්හත් තත්ත්වයෙන් ඔබ්බට යා යුතුය. සවන භූමියට පත්වන බෝධිසත්වයා විමුක්තියට අභිමුඛව සිටින්නකු පමණි. ඔහු විමුක්තියට මුහුණ ලා සිටියත් විමුක්තිය සාක්ෂාත් කිරීමට හැකියාවක් නැත. මෙම භූමියට අභිමුඛී යන නාමය යොදා ඇත්තේ ද එය නිෂ්ඨාව අභිමුඛියට බෝධිසත්වයකු පත්කරන නිසා විය යුතුය.

අර්හත් ශ්‍රාවකයකු මිදෙන්නේ ක්ලේශාවතරණයන්ගෙන් පමණක් යයි මහායානිකයෝ අදහස් කරති. මෙය පූර්ණ විමුක්තිය නොවේ යයි ද ඔවුන් දරන අදහසය. පූර්ණ වශයෙන් විමුක්තිය ලැබීමට නම් ඥෙයාවරණයන් ද ප්‍රහීන කළ යුතු ය. එය කළ හැක්කේ තව ඉදිරියට යැමෙන් බුද්ධත්වයට පත් වීමෙනි. භූමි සංකල්පය සංඛ්‍යාව අතින් වැඩි කොට භූමි මාර්ගය අධිශීල, අධිචිත්ත, අධිප්‍රඥා නම් වූ ශ්‍රාවක මාර්ගය අබිබවා යන්නක් වශයෙන් දැක්වීම අවශ්‍ය වූයේ මේ හේතුවෙනි.

*"වජ්‍රගර්භ මෙසේ කීයී පින්වත් ජිනපුත්‍රවැරනි, යම්සේ මේ බෝසත් තෙමේ හයවන බෝධිසත්ත්ව භූමියෙහි මනාව පරිපූර්ණ බෝධිසත්ත්ව මාර්ග ඇත්තේ සත්වන බෝධිසත්ත්ව භූමියට පැමිණෙයි. හෙතෙම මාර්ගාන්තර ආරම්භ විශේෂවූ දශ උපාය ප්‍රඥාඥාන අභිනිහෘතයන්ට පැමිණෙයි. ඒ දහය කවරේද යත්, ශූන්‍යතා අනිමිත්ත අප්‍රණිහත සමාධි සුපරිභාවිත මනසින් යුක්ත වූයේ මහා පුණ්‍යඥාන සම්භාර රාශියක් රැස්කරයී සියලු ධර්මයන්ගේ නෛරාත්ම්‍ය නිඃසත්වතාවයට අවතීර්ණ වන්නේ සතරාකාර අප්‍රමාණයන් වැඩීම අත්නොහරියි, පුණ්‍යධර්මයන්ගේ එකතුවක් වන පාරමිතාවන් පුරන්නේ කිසිදු ධර්මයක් කෙරෙහි නොඇලේ. සියලු ත්‍රෛධාතුකයන්ගෙන් වෙන්වූයේ එම ත්‍රිධාතුව ස්ථාපිත කරන අලංකාර කරන ක්‍රියාවන් කරයී සර්වප්‍රකාරයෙන්ම උපශාන්ත වූ හෙතෙම සියලු කෙලෙස් ගිනි විලින් ඈත් වූයේ සියලු සත්ත්වයන්ගේම රාග දෙවේශ ක්ලේෂ ගිනි ප්‍රගමනය කිරීමට කටයුතු කරයි. සියලු ධර්මයන් නිර්මාණ භාව අභාව ස්වභාවාදී ද්වන්ධයන්ගෙන් තොර හුදු මායාවක් මිරිඟුවක් ප්‍රතිභාසයක් දියෙහි ඇති චන්ද්‍ර ප්‍රතිබිම්බයක් දෝංකාරයක් බඳු යැයි අවබෝධ කරගන්නා හෙතෙම සියලු කර්මක්‍රියා*

*භේදයකින් තොරව ඉටුකිරීමේ කැමැත්ත ඇත්තේ වේ. ආකාශය බඳුවූ ක්ෂෙත්‍රමාර්ගයන්හි මනාව ප්‍රගුණකරන ලද සිත් ඇත්තේ බුද්ධක්ෂෙත්‍රයන් ස්ථාපිත කරන අලංකාර කරන ක්‍රියාවන්හි නිරත වේ සියලු බුදුවරයින්ගේ ප්‍රකෘතිවූ ධර්මකායට බැස ගන්නේ රූපකාය ස්ථාපනය කරන අලංකාර කරන අනුව්‍යඤ්ජන ලක්ෂණ ප්‍රදර්ශනය කරන්නේ වෙයි. ප්‍රකාශ කළ නොහැක්කාවූ ශබ්දයෙන් හා ඝෝෂාවෙන් විනිර්මුක්තවූ ප්‍රකෘතියෙන්ම ශාන්තවූ තථාගත ඝෝෂාව මුදාහරින්නේ සියලු ස්වරාංගයන්ගේ විශුද්ධ වූ අලංකාරය ප්‍රදර්ශනය කරයීභාග්‍යවත් බුදුවරුන්ගේ ඒකක්ෂණ ත්‍රෛකාල පිළිබඳ අවබෝධයට බැස ගන්නේ සත්ත්වයින්ගේ සිත් දියුණු කිරිම සඳහා  නානා ලක්ෂණයන්ගෙන් යුත් ඔවුන්ගේ සිතැගි වලට පිවිසෙයි මෙසේ දශාකාර වු උපාය ප්‍රඥාඥනාදියෙන් සමන්විත වු බෝසත් තෙමේ හය වෙනි භූමියෙහි සිට හත්වන භූමියට පිවිසෙන්නේ යැයි කියනු ලැබේ.''*[39]

බෝධිසත්ව භූමි සූත්‍රයෙහි භූමි හයක් පමණක් ගැන කෙරෙන සඳහනක් ද ඇත. මෙයින් ගම්‍ය වන්නේ එක් අවධියකදී නම් වශයෙන් සඳහන් කෙරෙන්නේ භූමි හයක් පමණක් ද යන්න නිශ්චිත වශයෙන් කිව නොහැකි බවය. එපමණක් නොව මෙම කෘතියෙහි එන බෝධිසත්ව භූමියෙහි ප්‍රධාන වශයෙන් සඳහන් කෙරෙන්නේ භූමි හතක් පමණක් බව නම් ඉතා පැහැදිලි ය. මෙයින් නිසැකයෙන් ම ගම්‍ය වන්නේ එක් අවධියක දී භූමි සංඛ්‍යාව හතකට පමණක් සීමා වී තිබුණු බව ය. ලංකාවතාර සූත්‍රය ද මේ ආකාරයෙන් භූමි හතක සංඛ්‍යාවක් දක්වයි. මහා වස්තුවෙනහි භූමි දහසක් නම් කෙරුණත් විස්තර ඉදිරිපත් කෙරෙන්නේ භූමි හතක් පිළිබඳව ය. මෙවන් සියලු කරුණුවලින් පැහැදිලි වන්නේ ශ්‍රාවක නිෂ්ඨාව එනම් අර්හත් ඵල ප්‍රාප්තිය අබිබවා බෝධිසත්වයකු ඉදිරියට යන බව පෙන්වීමට එක් අවධියකදී  භූමි හතින් සමන්විත චර්යාවන් පිළිගනු ලැබුණු බව ය.

භූමි සංඛ්‍යාව දහයක් ය යන මතය තහවුරු කිරීම සඳහා සම්පාදිත දශ භූමික සූත්‍රය වුවද මේ භූමි හත පිළිබඳ සංකල්පය දැන සිටි  බව එම සූත්‍රයේ ම කෙරෙන සඳහන් මගින් ප්‍රකට වේ. හත්වන භූමියට පත්වන බෝධිසත්වයා එහි දී සියලු ම පාරමිතාවන් පරිපූර්ණත්වයට ගෙන එන බවත් එම බෝධිසත්වයාට රිසි වන්නේ නම් එම භූමිය අවසානයේ නිර්වාණය සාක්ෂාත් කළ හැකි බවත් දශ භූමික සූත්‍රය දක්වයි.[40]

එහෙත් බෝධිසත්වයකුගේ ප්‍රණිධානය පුද්ගල නිර්වාණ සාක්ෂාත් කරණය අරමුණු කොට නොපවතී. මහායානය අනුව පුද්ගල විමුක්තිය සාක්ෂාත් කළ හැකි වන්නේ කළ යුතු වන්නේ අන් අයගේ විමුක්තිය සලසා දීම මගිනි. මේ අදහස ඉස්මතු කොට දක්වන දශ භූමික සූත්‍රය පවසන්නේ බෝධිචිත්තෝත්පාදය සමගම බෝධිසත්වයකු අධ්‍යාශ මහත්මය හේතුකොට ගෙන සියලු ම ශ්‍රාවක  ප්‍රත්‍යෙක බුදුවරුන් අභිභවනය කරන බවය.[41]

කරුණු මෙසේ නම් මෙම චර්යාව තවත් ඉදිරියට ගෙන යා යුතුමය. එසේ කළ හැක්කේ මහායානය මගින් දැඩිව අවධාරණය කෙරෙන පරහිතකාමී බව ප්‍රගුණ කිරීමෙනි. මහායානය අනුව බෝධිසත්ව චර්යාව ප්‍රායෝගික කළ හැකි වන්නේ මෙසේ පරහිතකාමී වීමට ප්‍රඥාපාය යන ගුණාංගද්වය මෙහෙයවීමෙන් පමණි. එසේ කරන තුරු බෝධිසත්වයකු සියලු ක්ලේශයන් ප්‍රහීණ කිරීමට සමත් වන්නේ නැත. පාරමිතා පූරණය කිරීම නිසා මේ වන විට ද බෝධිසත්වයෙක් සියලු ක්ලේශයන් හඳුනාගෙන සිටී. එහෙයින් හෙතෙම ක්ලේශයන්ගෙන් නොතැවරේ. එහෙත් හේ සියලු ක්ලේශයන් අතික්‍රමණ කළේ යයි නොකිව යුතුය.[42]

දශභූමි සූත්‍රය හත්වන භූමිය සලකන්නේ ශ්‍රාවක නිෂ්ඨාව අබිබවා පාරිශුද්ධ බෝධිසත්ව චර්යාවට සංක්‍රමණය වන අවස්ථාව ලෙස ය. අටවන බෝධිසත්ව භූමියට පත්වන බෝධිසත්වයා සියලු ලෞකික ක්‍රියාවන්ගෙන් ඔබ්බට ගියේ වෙයි. එහෙයින් හෙතෙම සියලු ක්ලේශ දෝෂයන්ගෙන් නොතැවරුණේ ඒවා අතික්‍රාන්ත කළේ වෙයි. හත්වන භූමියේහිදී වුවද ක්ලේශ දෝෂයන් සමතික්‍රමණය කර ඇති සේ අසංක්ලේශ වෙයි. එහෙත් හෙතෙම අනිශ්ක්ලේශීය. සියලු ක්ලේශයන් හට නොගන්නා හෙයින් හෙතෙම අසංක්ලේශ ය. නැතහොත් ක්ලේශ සහිත නොවේ. එහෙත් හෙතෙම අනිශ්ක්ලේශීය එනම් පූර්ණ වශයෙන් නිශ්කේහී නොවේ. එසේ වන්නේ ඒ බෝධිසත්වයා තථාගත ඥානය සඳහා අභිලාෂයෙන් සිටිනා අතර එම අභිප්‍රාය පරිපූර්ණත්වයට පත්ව නොමැති හේතුවෙනි.[43]

අසංක්ලේශ සහ අනිශ්ක්ලේශ යනුවෙන් ඉතා සියුම් බෙදීමක් කර ඇත්තේ ද ශ්‍රාවක නිෂ්ඨාව අභිභවා තව ඉදරියට බෝධිසත්වයකු යා යුතුව ඇත යන අදහස දැඩිව අවධාරණය කරනු පිණිස ය.

"*මේ සත්වන බෝසත් භූමියෙහි සිටියාවූ බෝධිසත්ත්වයා තවදුරටත් රාගාධිප්‍රමුඛ සියලු කෙලෙස් සමූහයා අතික්‍රාන්ත කළේ වෙයි මේ දූරංගම බෝසත් භූමියෙහි හැසිරෙන බෝධසත්ත්වයා අසංක්ලේෂ අනික්ලේෂ යැයි දත යුතුයි ඒ කවර හෙයින්ද යත්; ඒ ක්ලේෂයන්ගේ පැවැත්මක් නැති හෙයින් ක්ලේෂ රහිත යැයි (අසංක්ලිෂ්ට) කිව යුතුයි තථාගතඥාන අභිලාෂයෙන් පරිපූර්ණ අභිප්‍රාය ඇති බැවින් අනික්ලේෂී වූයේ යැයි කිවයුතුයි. (    )*

මෙසේ සියුම් විශ්ලේෂණයක් නොකොට භූමි සංඛ්‍යාව වැඩි කිරීම සාධාරණීයකරණය කිරීමට ද ඉඩක් නොවීය. මේ අතින් සලකා බලන කල හත්වන එනම් දූරංගමා නම් භූමිය ඉතා වැදගත් තැනක් දරන බව පැහැදිලි වේ. මෙම භූමිය විස්තර කිරීමේ ප්‍රධාන අරමුණ වී ඇත්තේ බෝධිසත්ත්ව ශ්‍රාවක චර්යාවට වඩා සෑම අංශයකින් ම ශ්‍රේෂ්ඨ බව හුවා දැක්වීමට ය.

*"හෙතෙම මෙසේ මහාභිඥාඥානමුඛපූරණය ප්‍රමුඛකොට භූමි පරිශෝධකවූ සමාධි සිය දහසකට පැමිණේ හෙතෙම උපාය ප්‍රඥාවෙන් පරිශෝධිත වූ කරුණාබලයෙන් ලැබුණාවූ මේ සමාධීන්ගෙන් ශ්‍රාවක ප්‍රත්‍යෙක, බුද්ධ භූමින් අතික්‍රමණය කළේ වෙයි ප්‍රඥාඥාන විචාරණ භූමියට අභිමුඛවූයේද වේ."*[45]

*"මේ සත්වන භූමියෙහි පිහිටියාවූ බෝසත් තෙමේ හට විෂයඥාන මහාත්වයෙන් සියලු ශ්‍රාවක ප්‍රත්‍යෙක බුද්ධ ක්‍රියා ඉක්මවන්නේ වෙයි."*[46]

*"විමුක්තිචන්‍ද්‍ර මෙසේ ඇසීයී කිනම් භූමියක් මත පිහිටා බෝසත් නිර්වාණයට පැමිණියේද? වජ්‍රගර්භ මෙසේ පිලිතුරු දුන්නේය. හයවන බෝසත් භූමිය පදනම්කොට ගෙන බෝසත් නිරොධයට පැමිණේ. මේ සත්වන බෝසත් භූමියෙහි පිහිටියාවූ බෝසත් චිත්තාක්ෂණයක් චිත්තාක්ෂණයක් පසා නිරෝධයට පැමිණේ. නිරෝදය සක්‍ෂාත් කළේ යැයි නොකිව යුතුය. ඔහු ඒ අචින්ත්‍ය වූ කාය වාක් මනස් කර්මයෙන් සමන්වාගත යැයි කියනු ලැබේ. යම්තැනෙක බෝසත් තෙමේ භූතකෝටි විහාරයෙන් වාසය කරයිද නිරෝධය සාක්‍ෂාත් නොකරයිද එය ආශ්චර්යකි පින්වත් ජිනපුත්‍රවැරනි යම් දක්‍ෂ පුරුෂයෙක් මහාසාගර ජලයෙහි ලක්‍ෂණ දන්නේ පණ්ඩිත ව්‍යක්ත නුවණැති විමසීමෙන් මහාසාගරයේ ගිලුණු නැව්ද ජලයද දූකීමෙහි දක්‍ෂවේද එසේම මේ සත්වන බෝසත් භූමියෙහි සිටියාවූ බෝධිසත්ත්වයා සර්වඥාන මහා සාගරයට අවතීර්ණ වූයේ පාරමිතා මහායානයෙහි පතුලට බැසගන්නේ භූත කෝටි විහාරයෙන් වාසය කරයි. නිරෝධය සාක්‍ෂාත් නොකරයි."*[47]

*"පින්වත් ජිනපුත්‍රය, මේ බෝධිසත්ත්වයාගේ අටවැනි අචලා නම් ඥානභූමිය යැයි කියනු ලැබේ. සියලු ලෝකඥානත්වයෙන් පහසුවෙන් එළඹිය නොහැකි භූමි යැයි කියනු ලැබේ. අනවධ්‍යත්වයෙන් කුමාරභූමි යැයි කියකු ලැබේ. නැවත කිරීමට කාර්යයක් නොමැති බැවින් පරිනිෂ්පත්න භූමි යැයි කියනු ලැබේ. මනාව කරන ලද ඥානවිචයත්වයෙන් පරිනිෂ්ටිත භූමි යැයි කියනු ලැබේ. ස්වභිනිර් හතප්‍රණීධ්‍යානත්වයෙන් නිර්මාණභූමි යැයි කියනු ලැබේ. පරාවිකෝපතත්වයෙන් අධිෂ්ඨානභූමි යැයි කියනු ලැබේ. පූර්වාන්ත අභිනිර්හතත්වයෙන් අනාභෝග භූමි යැයි කියනු ලැබේ."*[48]

ප්‍රධාන භූමි හයට පසුව එක් කරනු ලැබුණ භූමි හතර මගින් අලුත් යමක් ප්‍රකාශ කෙරෙන බවක් දක්නට නැත. ඇත්ත වශයෙන් ම මෙම භූමි හතර මින් ප්‍රකට කෙරෙන ඊට කලින් ඇති භූමිවලදී ප්‍රගුණ කරන ලද ගුණාංගම තව දුරටත් වර්ධනය කරයි.

භූමි සංඛ්‍යාව දහය දක්වා වැඩි කිරීමේ දී එකල ප්‍රචලිතව පැවති දශ පාරමිතා සංකල්පය ඉවහල් වුණු බව පැහැදිලි ය. එහෙත් මෙසේ එක් කරන ලද පාරමිතා සංකල්පය ඉවහන් වුණු බව පැහැදිලි ය. එහෙත් මෙසේ එක් කරන ලද පාරමිතා හතරෙන් තුනක්ම එනම් ප්‍රණිධාන බල සහ ඥාන පාරමිතා තුන මගින් බෝධිසත්ත්ව චර්යාවට අලුතින් කිසිවක් එක් කෙරෙන්නේ නැත. බෝධි චිත්තෝත්පාදයට අමතරව ප්‍රණිදානය පාරමිතාවක් වශයෙන් නම් කිරීම  හුදෙක් පුනරුක්තියක් බඳුය. වීර්ය පාරමිතාවට අමතර බල පාරමිතාවත් ප්‍රඥා පාරමිතාවට අමතරව ඥාන වශයෙන් පාරමිතාවත් එකතු කිරීම භූමි සංඛ්‍යාව වැඩි කිරීමට දරන ලද එතරම් සාර්ථක නැති උත්සාහයක් සේ සැලකිය හැකිය.

මේ උත්සාහය කිසියම් දුරකට හෝ සාර්ථක වී ඇත්තේ උපාය නැතහොත් උපාය කෞශල්‍ය පාරමිතාව මෙම සැලැස්මට එකතු කිරීම හේතුකොට ගෙන ය. ඇත්ත වශයෙන් ම බෝධිසත්ත්වයකු ශ්‍රාවක නිශ්‍රාව පසු කර බොහෝ ඉදිරියට යන යා යුතු අයකු බව හුවා දැක්වීමට උපකාරී වී ඇත්තේ මෙම පාරමිතාව ය. බෝධිසත්ත්වයා පුද්ගල විමුක්තිය පරදුවට තබා අන් අය විමුක්තිය කරා යොමු කිරීමට ගෙන යෑමට කැපවුණු පරාර්ථකාමී උත්තමයෙක්ය යන්න අවධාරණය කිරීමට මෙම පාරමිතාව බෙහෙවින් වහල් වී ඇත. මහායානයෙහි ඉදිරිපත් කෙරෙන බෝධිසත්ව  සංකල්පයේ සුවිශේෂ ලක්ෂණය ද මෙය  ය. ශ්‍රාවක නැතහොත් අර්හත් නිශ්‍රාව පුද්ගල විමුක්තිය කේන්ද්‍රිය කොට පවතින්නේ යැයි එල්ල කෙරුණු චෝදනාව වඩාත් සාධාරණීකරණය කිරීමට මහා කරුණා ගුණය ප්‍රායෝගිකව උපයෝගී කොටගෙන සියලු ෂත්ත්ව විමුක්තිය ඇති කිරීමට බෝධිසත්ත්වයකු  සමත් වන බව පෙන්වීමට මේ උපාය කෞශල්‍ය පාරමිතාව පරිපූර්ණත්වයට පත් කිරීම අතිශයින්ම වැදගත් වන බව දශභූමික සූත්‍රය මගින් තහවුරු කරනු ලැබ ඇත.

---

පාදක සටහන්

1. Edgertaon, F., *Buddhist Hybrid Sanskrit Grammar and Dictionary*, Vol.II, p.446,Motilal, Banarisidass, Delhi, 1993
2. Santiva, Perter, Della, *The Tree of Englightenment*, p.187, Taiwan, Corporative body of the Buddha Education Foundation, 1999
3. මජ්ඣිමනිකාය, I 246,  බුද්ධ ජයන්ති සංස්කරණය නාහං භික්ඛවෙ ආදිකෙනෙව අඤ්ඤාරාධනං වදාමි. අපිච භික්ඛවෙ අනුපුබ්බසික්ඛා අනුපුබ්බකිරියා අනුපුබ්බපටිපදා අඤ්ඤාරාධනා හොති.”
4. Pali-English Dictionary (PTS) “Bhumi”
5. Endo, T. *Buddha in Theravada Buddhism*, p.264,Systematic print, Nadimala, 1997.

6. Hirakawa, Akira, *A History of Indian Buddhism*, From Sakyamuni to Early Mahayana p.263, Delhi, Moatilal Banarisidass, 1993.
7. Encyclopadea of Buddhism, Vol. III,p.80, The Government of Ceylon, Colombo, 1973.
8. Edgertaon, F., Buddhist Hybrid Sanskrit Grammar and Dictionary, Vol.II, p.279,Motilal, Banarisidass, Delhi, 1993
9. Encyclopadea of Buddhism, Vol. III, p.74, The Government of Ceylon, Colombo, 1973.
10. Bapat, P.V. 2500 Years of Buddhism, p.82, Government of India, Delhi, 1956
12. Encyclopadea of Buddhism, Vol. III,p.81, The Government of Ceylon, Colombo, 1973
13. Encyclopadea of Buddhism, Vol. III,p.78, The Government of Ceylon, Colombo, 1973
14. Encyclopadea of Buddhism, Vol. III,p.80, kak Har Dayal f.a Bodhisattva Doctrine in Buddhist Sanskrit Literature ,p.275. “This Treatise mention bhumis to which it doesen’t assign any name”. 1973
15. බෝධිසත්ත්වභූමි නම් කෘතිය පිළිබඳව විචාරාත්මක ඇගයුමක් සඳහා බලන්න Encyclopadea of Buddhism, Vol. III,p.233, The Government of Ceylon, Colombo, 1973
16. Har Dayal, f.a.Bodhisattva Doctrine in Buddhist Sanskrit Literature, p.283
17. මේ එක් එක් භූමියේ අන්තර්ගතය පිළිබඳ විස්තරයක් දශභූමික සූත්‍ර පරිවර්තනයේ දක්වා ඇත.
18. Encyclopadea of Buddhism, Vol. III, p.283, The Government of Ceylon, Colombo, 1973
19. Endo, T. Buddha in Theravada Buddhism, p.268, Systematic print, Nadimala, 1997.
20. -Ibid- p.268
21. -Ibid- p.267
22. -Ibid-p.268
23. Har Dayal, Bodhisattva Doctrine in Buddhist Sanskrit Literature, p.167.
24. -Ibid- p.168

25. Endo, T. Buddha in Theravada Buddhism, p.271, Systematic print, Nadimala, 1997.

26. විස්තර සඳහා බලන්න Bodhisattva Doctrine in Buddhist Sanskrit Literature, p.171

27. බලන්න Bodhisattva Doctrine in Buddhist Sanskrit Literature, Encyclopaedia of Buddhism, "Gotrabuhu" p.283

28. ගෝත්‍රභූ තත්ත්වයේ සිටි අයෙක් නවවන අරියපුද්ගලයා වශයෙන් සැලකෙති. බලන්න Buddhist Dictionary by Nanatilaka, p.60 Encyclopaedia of Buddhism, "Gotrabhu"

29. 2. Vaidya,P.L., Dasabhumikasutram,
Buddhist Sanskrit Texts – No.7, The Mithila Institute Post-graduate Studies and Research in Sanskrit lerning, Darbhangha, 1967

දශභූමික සූත්‍රය පී. එල්. වෛද්‍යගේ සංස්කරණය 133 පි හත්වන භූමිය ගැන විස්තර කරන දශභූමික සූත්‍රයේ මෙසේ සඳහන් වේ. විමුක්ති චන්ද්‍ර ආහ. කතමාං භූම්මුපාදාය බෝධඃසත්වො නිරෝධං සමාපද්‍යතෙ වජ්‍රගර්භ ආහ
ෂෂ්ඨිං හෝ ජිනපුත්‍ර බෝධිසත්වභූමිමුපාදාය බෝධිසතවො නිරෝධං සමාපද්‍යතෙ. අස්‍යාං පුනඃ සප්තම්‍යං බෝධිසත්‍වභූමෞ ප්‍රතිෂ්ඨිතො බෝධිසත්ත්‍වශ් චිත්තක්‍ෂණෙ චිත්තක්‍ෂණෙ නිරෝධං සමාපද්‍යතෙ ච ව්‍යුත්තෂ්ඨතෙ ච න ච නිරෝධඃ සාක්‍ෂාත් කෘති ඉති වක්තව්‍යං

30. -එම- පි

31. -එම - පි
32. -එම - පි
33. -එම - පි
34. -එම - පි
35. -එම - පි
36. -එම - පි
37. -එම - පි
38. -එම - පි
39. -එම - පි

40. දශභූමික සූත්‍රය පී. එල්. වෛද්‍යගේ සංස්කරණය 133 පි හත්වන භූමිය ගැන විස්තර කරන දශභූමික සූත්‍රයේ මෙසේ සඳහන් වේ. විමුක්ති චන්ද්‍ර ආහ. කතමාං භූම්මුපාදාය බෝධඃසත්වො නිරෝධං සමාපද්‍යතෙ වජ්‍රගර්භ ආහ
ෂෂ්ඨිං හෝ ජිනපුත්‍ර බෝධිසත්වභූමිමුපාදාය බෝධිසතවො නිරෝධං සමාපද්‍යතෙ. අස්‍යාං පුනඃ සප්තම්‍යං බෝධිසත්‍වභූමෞ ප්‍රතිෂ්ඨිතො බෝධිසත්ත්‍වශ් චිත්තක්‍ෂණෙ චිත්තක්‍ෂණෙ නිරෝධං සමාපද්‍යතෙ ච ව්‍යුත්තෂ්ඨතෙ ච න ච නිරෝධඃ සාක්‍ෂාත් කෘති ඉති වක්තව්‍යං

41. එම 132 පි.

සහචිත්තෝත්පාදෙන සර්වශ්‍රාවකප්‍රත්‍යෙකබුද්ධානිහිභවත්‍යාංශය මහාත්මෙ‍්‍යන

42. එම 69 පි

ස එපාං සමාධිනාමුපායප්‍රඥා සුපරිශෝධිතානං ප්‍රතිලම්භාන්

මහා කරුණා බලෙන වාතික්‍රාතො භවති ශ්‍රාවක-ප්‍රත්‍යෙක-බුද්ධභූමිං අභිමුඛශ්ච භවති

ප්‍රඥාඥාන විචාරණා භූමේ.

43. එම 13 පි.

ප්‍රථමාං භූම්මුපාදාය බෝධිසත්ත්වඃ පාමිතායානාභිරුඪී

සර්වජගදනුවිචරන් සංක්ලේශ දෝෂාන් ප්‍රජානාති න ච

තෛර්දෝසෛර්ලිප්‍යතෙ සම්‍යග්මාර්ගාභිරුඪත්වා නව තාවත් සමතික්‍රාන්ත

සර්වජගත් සංක්ලේශදෝෂාන් වක්තව්‍යඃ

44. එම 131 පි.

සොස්‍යාං සුරංගමායාං බෝධිසත්ව භූමෞ ෂරන් බෝධිසත්වො සංක්ලේශානිශ්ක්ලේශ

ඉති

වක්තව්‍යඃ තත්කස්මාත්ඉ අසුමදාචාරාත් සර්වක්ලේශානාං නසංක්ලේශ ඉති වක්තව්‍යඃ

තථාගතඥානාභිලාසාදපරිපූර්ණාභිප්‍රායත්වාච්ච න නිශ්ක්ලේශ ඉති වක්තව්‍යඃ

45. එම පි.

46. එම පි.

47. එම පි.

48. එම පි.


45. Vaidya,P.L., Dasabhumikasutram,
Buddhist Sanskrit Texts – No.7, The Mithila Institute Post-graduate Studies and Research in Sanskrit lerning, Darbhangha, 1967